කන්තලේ ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 21 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 04 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ඔක්තෝම්බර් 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සභා සංවර්ධන අරමුදල යටතේ ලැබුණු රු. 23,837,388 ක මුදලින් ගොඩනැඟිලි ඉදිකිරීම හා මාර්ග අළුත්වැඩියා කිරීම සඳහා රු. 16,433,252 ක් වියදම් කර 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ රු. **7,404**,136 ක මුදල පුනරාවර්තන ආදායමට ගැනීම තුලින් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වින.

(ආ) කොන්ත්‍රාත්වලට අදාලව වැඩ ආරම්භ කිරීම සඳහා ගෙවූ රු. 3,169,721 ක අත්තිකාරම් වලින් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 2,664,668 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රැඳවුම් මුදල රු. 2,493,993 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 338,347 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 774,912 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ස්ථාවර තැන්පතු පොලී රු. 406,565 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2013 වර්ෂයේ සභාවට භාරදුන් කඩ කාමර 66 කින් යුත් පොදු වෙළඳපලේ ගොඩනැඟිල්ලෙහි සහ කඩ කාමර 24 කින් යුත් බස් නැවතුම්පලේ ගොඩනැඟිල්ලෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට කඩ කුලී හිමියන් 26 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 1,917,005 ක කඩ කාමර කුලී වලින් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වැඩිපුර ගෙවූ රු. 92,110 ක කුලී වගකීම යටතේ ගිණුම්ගත නොකර ලැබිය යුතු කුලී වලින් හිලව් කර තිබීම නිසා ලැබිය යුතු කඩ කාමර කුලී රු. 1,824,895 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු කඩ කාමර කුලී රු. 92,110 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
-----------------------------------------

විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා රු.30,189,973 ක වටිනාකම වූ වත්කම් විෂයයන් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.3 නීති, රීති, රෙගුලාසි අනුකූල නොවීම්.
--------------------------------------

**විගණනයේදී නිරීක්ෂණය** වූ නීති,රීති,රෙගුලාසි සහ විධිවිධාන වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය | සභාබල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 18 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) පළාත් මූල්‍ය රීති අංක 237 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 64,990 ක් වටිනා චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,405,689 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 4,846,449 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

(අ) සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,850 | 2,371 | 10,852 |
| බදු කුලී | 16,802 | 3,954 | 1,825 |
| බලපත්‍ර ගාස්තු | 734 | 856 | - |
| වෙනත් ආදායම් | 7,546 | 6,976 | 4,000 |

2.2.2 මුද්දර ගාස්තු

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හදුනා ගෙන සහ ලබා ගැනීම සඳහා විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 23 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**3.1.1** ඉදිකර තිබූ පොදු වෙළඳපල හා බස් නැවතුම්පල කඩ කාමර වෙළඳුන්ට ලබා නොදීම

2011 වර්ෂයේ දී පැරණි කඩ කාමර 32 ක් කඩා ඉවත් කර නව පොදු වෙළඳපොලේ කඩ කාමර 66 ක් සහ බස්නැවතුම්පලේ කඩ කාමර 24 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් නිමකර 2013 මාර්තු 27 දින ප්‍රා දේශය සභාවට භාර දී තිබුණත් එකී කඩ කාමර 90 සභාවට පවරාගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.

3.1.2 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම

2014 ජුලි 02 දින පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 23 ක් අළුත්වැඩියා කිරීම හා ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 138 ක් සහ පොත් 363 ක් ඉවත් කර නොතිබුණි.

(ආ) පුස්තකාල 04 කට අදාල අස්ථානගත වී තිබූ බවට හඳුනාගත් පොත් 4948 ක් සම්බන්ධයෙන් අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) බඩු වට්ටෝරු පොත් නැවත සකස් කිරීම

3.2 ඌණ උපයෝජිත වත්කම්

1997 වර්ෂයේ දී මිලදී ගත් වෑන් රථය 2013 නොවැම්බර් මාසයේ සිටද, 1987 වර්ෂයේ දී මිලදී ගත් ට්‍රැක්ටරයක් **2012** අප්‍රේල් සිට ද, 2008 වර්ෂයේ දී මිලදී ගත් කැබ් රථය 2015 ජුනි මස සිටද ක්‍රියාවිරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණත් ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

3.3.1 විදුලි ආදාහනාගාරය ඉදිකිරීම

2012 නොවැම්බර් 08 දින රු. 15,848,605 ක කොන්ත්‍රාත් වටිනාකමට කන්තලේ නගරයේ විදුලි ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) මෙම ඉදිකිරීමට අදාලව රු. 3,169,721 ක් 2012 නොවැම්බර් 20 දින අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරුට කලවැඩ වටිනාකමට ගෙවා තිබූ රු. 9,848,484 ක වටිනාකමින් රු. 505,053 ක් පමණක් අත්තිකාරම් ලෙස අඩු කර ගෙන තිබුණි.

(ආ) රු. 3,169,721 ක් වූ අත්තිකාරම් බැඳුම්කරයේ වලංගු කාලසීමාව 2013 ඔක්තෝම්බර් 30 දින අවසන් වී තිබුණද, විගණිත දිනය වන විටද එය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු. 792,430 **ක කාර්යසාධන** බැඳුම්කරයේ වලංගු කාලසීමාව 2013 මාර්තු 30 දින දීර්ඝ කර ගෙන තිබුණද, පසුව විගණිත දිනය වන විටද එය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 9,848,484 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බදු වන රු. 24,621 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.3.2 බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම

සභාව 2014 මාර්තු 18 දින රු. 51,093,960 ක කොන්ත්‍රාත් වටිනාකමට බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගිවිසුම්ගත දින සිට මාස 06 ක් ඇතුලත ඉදිකිරීම් අවසන් කල යුතු වුවද, විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 23 දින වන විට ඉදිකිරීම් කාර්යසාධනය සියයට 38 ක් පමණ පහළ මට්ටමක පැවතුණි.

(ආ) වර්ග මීටර 1192 ක් වූ ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් තට්ටුවෙන් වර්ග මීටර් 895 ක ප්‍රමාණයකට කොන්ක්‍රීට් යොදා තිබුණි. ඉතිරි වර්ග මීටර් 297 ක ප්‍රමාණයට සැටරිම මත කම්බි අතුරා තිබුණද, මාස 03 කට වැඩි කාලයක සිට කොන්ක්‍රීට් යොදා නොතිබීමෙන් කම්බි මලකඩ බැඳීමට ලක්වී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය ඉතා අවම මට්ටමක පැවති අතර මාස තුනකට වැඩි කාලයක සිට ඉදිකිරීම් අත්හැර දමා තිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

සභාව, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2011 ජූලි 25 දින ප්‍රජා මණ්ඩල සමිතියක් සමග රු. 324,530 ක කොන්ත්‍රාත් වටිනාකමට ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2012 ජනවාරි 25 දින වන විට ඉදිකිරීම් අවසන් කල යුතු වුවද, විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 23 දින වන විට ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තියට අනුව පවරන ලද වැඩ උප කොන්ත්‍රාත් නොදිය යුතු වුවද, කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් උප කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබූ බව තහවුරු විය.

3.5 මානව සම්පත් කළමනාකරණය
------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව
------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 03 | 01 | 02 |
| ද්විතික මට්ටම | 22 | 18 | 04 |
| තෘතීය මට්ටම | 38 | 35 | 03 |
| එකතුව | **63** | **54** | **09** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 අප්‍රේල් මස සිට පුරප්පාඩු පවතින සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විගණිත දින වන විටද කටයුතු කර නොතිබුණු අතර, වැඩබැලීමේ පදනම මත ලේකම්වරයකු පත්කර තිබුණි.

(ආ) ආයුර්වේද වෛද්‍ය නිලධාරි, සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂක, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ ආදායම් පරිපාලනය

(ඇ වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කලමනාකරණය